# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
අரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Services, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site


මගේ අංකය / எனது இல / My No: COM/Trans/Gen
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி: / Date: 2021.08.19

සියළු අමාත්‍යාංශ / රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>කොවිඩ් 19 වසංගත තත්වය යටතේ ඒකාබද්ධ සේවා අංශයේ රාජකාරීන් පවත්වාගෙන යාම සම්බන්ධව</u>**

දැනට රට මුහුණ දෙමින් පවතින කොවිඩ් 19 වසංගත තත්වය තුල ඒකාබද්ධ සේවා අංශයේ නිලධාරීන් රෝගී තත්වයෙන් පෙළීම හේතුවෙන් ඇතැම් අංශයන් හදිසියේ වසා දැමීමට සිදු වේ. මෙම තත්වය යටතේ සාමාන්‍ය රාජකාරි කටයුතු පෙර පරිදිම පවත්වාගෙන යාමට බාධා පැමිණෙන බැවින් සිදු කරන සියළු විමසීම් සඳහා පිළිතුරු ලබා දීමේ දුෂ්කරතාවයන් ඇතිවේ.

02. එබැවින් නිලධාරීන්ට සිදුවන අපහසුතාවයන් සලකා බලා ඒකාබද්ධ සේවා අංශයෙන් සිදු කරන විමසීම් සඳහා පහත පරිදි කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

**<u>ඇ. ඒකාබද්ධ සේවා අංශයේ මාර්ගගත විමසීම (CS Inquiry)</u>**

ඒකාබද්ධ සේවයේ සියළු නිලධාරීන් සඳහා LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://10.250.1.112/misco/ වෙබ් ලිපිනයෙන්ද වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://43.224.125.38/misco/ ඔස්සේද මාර්ගගත ක්‍රමයට ඒකාබද්ධ සේවයේ තොරතුරු පද්ධතියට ඇතුලත් විය හැකි අතර එහි මෙනුවෙහි ඇති CS Inquiry ඔස්සේ තම විමසීම් එහි දර්ශකයේ (Index) දක්වා ඇති පරිදි අදාල අංශ වෙත යොමු කල හැක.

**<u>ආ. ඊමේල් ඔස්සේ විමසීම සිදු කිරීම</u>**

පහත දක්වා ඇති ඊමේල් ලිපිනයන් ඔස්සේද විමසුම් යොමු කල හැක. මෙම විමසුම් යොමු කිරීමේදී අදාල අංශය නිවැරදිව තෝරා යොමු කිරීම තුලින් කඩිනමින් අදාල විමසුම් සඳහා ක්‍රියා මාර්ග ගැනීම පහසු වන අතර, සේවා අවශ්‍යතාවයන්ගෙන් පරිබාහිර විමසුම් යොමු නොකරන ලෙසද නිලධාරීන් දැනුවත් කිරිම මැනවි.

03. අදාල විමසුම් යොමු කිරීමේදී CS Inquiry ඔස්සේ මාර්ගගතව යොමු කිරීම වඩාත් සුදුසු බව දන්වා සිටින අතර, එසේ කල නොහැකි නම් පමණක් ඉහත දක්වා ඇති ඊමේල් ලිපිනයන් වෙත තම විමසුම් යොමු කිරීමට නිලධාරීන් දැනුවත් කල යුතු වේ. අදාල කාරණය පැහැදිලිව ඊමේල් පණිවුඩයේ Subject හි සඳහන් කල යුතු වේ. එමෙන්ම ඒ සඳහා කිසියම් ඇමුණුමක් (Attachment) යොදා ගැනීමට නිලධාරියා අපේක්ෂා කරයි නම් එය PDF ආකෘතියට ඉදිරිපත් කල යුතු අතර පිටු කිහිපයකින් සමන්විත වේ නම් එක් ආකෘතියකට (Merge) සාදා ඊමේල් පණිවුඩයේ ඇතුලත් කරන්න. එමෙන්ම ඊමේල් පණිවුඩය පහත ආකෘතියට අනුව යොමු කල යුතු වේ.

| |
|---|
| නිලධාරියා අයත් සේවාව<br>ලිපිගොනු අංකය හෝ සේවක අංකය<br>සේවා ස්ථානය<br>කාරණය<br>සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය |

| තනතුර | ඊමේල් ලිපිනය |
|---|---|
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් | dgcs.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ I (කළමනාකරණ සේවා නිලධාරී සේවය) | dcs1.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ II ( ශ්‍රී.ලං.තො.ස.තා.සේ,විනය,විභාග හා බඳවාගැනීම්) | dcs2.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ III (රජයේ භාෂා පරිවර්තක සේවය , ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය , ඒකාබද්ධ රියදුරු සේවය හා කාර්යාල සේවක සේවාව) | dcs3.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ IV (සංවර්ධන නිලධාරී සේවය) | dcs4.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ(කළමනාකරණ සේවා නිලධාරී සේවය- I ශ්‍රේණිය) | adcs1.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවය- II ශ්‍රේණිය) | adcs2.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවය- IIIශ්‍රේණිය) | adcs3.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ(IV ශාඛාව - ක.සේ.නි.සේ. ස්ථානමාරු හා අධිශ්‍රේණිය) | ddcs4.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ ( V ශාඛාව - කාර්යාල සේවක සේවාව) | adcs5.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (VI ශාඛාව - රජයේ භාෂා පරිවර්තක සේවය , ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය , ඒකාබද්ධ රියදුරු සේවය) | adcs6.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (VII ශාඛාව - ශ්‍රී.ලං.තො.ස.තා.සේ) | ddcs7.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරි සේවය-ස්ථාන මාරු) | adcsdos1.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරි සේවය-ස්ථිර කිරීම්) | adcsdos2.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරි සේවය-උසස් කිරීම්) | adcsdos3.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරි සේවය- ස්ථිර කිරීම්) | adcsdos4.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරි සේවය-ප්‍රතිපත්ති හා අන්තර්ග්‍රහණ) | adcsdos5.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (බඳවාගැනීම් සහ විභාග ශාඛාව) | adcs.rec.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (විනය ශාඛාව) | adcs.disc.pubad@gmail.com |
| පරිපාලන නිලධාරි (පාලන ශාඛාව) | aocs.pubad@gmail.com |

04. ඔබ ආයතනයේ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් පහත කරුණු සම්බන්ධයෙන්ද දැනුවත් කිරීම මැනවි.

i. 2021/08/06 දින වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය ප්‍රකාශයට පත් කර ඇති බැවින් **සාමාන්‍ය හා සුහද ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු සිදු නොකරන බව හා** එවැනි ස්ථාන මාරු සඳහා ඒකාබද්ධ සේවා අංශයෙන් පරිබාහිර පාර්ශවයන් විසින් සිදු කරනු ලබන ප්‍රචාරයන් සඳහා නොරැවටෙන ලෙසද, එවැනි පාර්ශවයන්ට තම තොරතුරු ලබා දීමෙන් වලකින ලෙස

ii. ඒකාබද්ධ සේවා අංශය සම්බන්ධ කිරීම සඳහා ඉහත පහසුකම් සපයා ඇත්තේ, අසීරුතා මධ්‍යයේ වුවද කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාමට වන බැවින් ඒකාබද්ධ සේවා අංශය වෙත සෘජුව පැමිණ සිදු කරන විමසීම් වලින් වලකින ලෙස

05. මෙම අසීරු කාලය තුල ඒකාබද්ධ සේවයේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මෙතෙක් ඔබ විසින් දක්වන ලද සහයෝගයට ස්තූතිවන්ත වන අතර, ඉහත දක්වා ඇති උපදෙස් අනුව කටයුතු කරන මෙන් ඔබ ආයතනයේ නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්